# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை.

The Secretariat, Colombo 01.
Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | 011 - 2484500<br>011 - 2484600<br>011 - 2484700 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 - 2449823 | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.treasury.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BD/CBP/01/01/15/2024 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.08.12 |

**ජාතික අයවැය චක්‍රලේඛ අංක : 02/2024**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

## 2025 වසර සඳහා අයවැය කැඳවීම

### 2025 - 2027 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව තුළ 2025 වාර්ෂික වැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත හා 2025-2027 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට (MTFF) අනුකූලව 2025 වර්ෂයේ අයවැය පිළියෙල කිරීමට අපේක්ෂා කෙරේ. කාර්යක්ෂමතාවය ප්‍රශස්තකරණය සහ සම්පත් උපයෝජනයේ ඵලදායිතාවය සහතික කිරීම උදෙසා ප්‍රමාණවත් පරිදි රාජ්‍ය අරමුදල් ක්‍රමෝපායික අයුරින් යෙදවීම සහතික කරමින්, රාජ්‍ය මූල්‍ය විනය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ විචක්ෂණශීලීත්වය සහතික කිරීම සඳහා 2025 අයවැය සකස් කෙරෙනු ඇත. වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා වියදම් කිරීමේ ආයතන වෙත අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම මෙම චක්‍රලේඛයේ අරමුණ වේ.

2022 වර්ෂයේ දී උච්චතම අවස්ථාවට එළැඹි දැඩි සහ පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයෙන් අනතුරුව, පසුගිය වසර දෙක තුළ රජය විසින් විස්තීර්ණවූත්, එකිනෙකට සම්බන්ධවූත් සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම ප්‍රයත්නයේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ඉදිරියෙන්ම පවතී. 2021 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 5.7% ක් වූ ප්‍රාථමික අයවැය හිඟය 2023 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.6%ක් වූ ප්‍රාථමික අයවැය අතිරික්තයක් බවට පරිවර්තනය කිරීමට මෙම ප්‍රතිසංස්කරණ තුළින් හැකිවී තිබේ. රාජ්‍ය ආදායම ක්‍රමිකව වැඩිවෙමින් පවතින අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරන මූල්‍යයනය (සරලව මුදල් අච්චුගැසීම ලෙස හැඳින්වෙන) 2023 සැප්තැම්බර් මැද භාගයේ සිට අත්හිටුවා තිබේ. මෙකී ක්‍රියාවලින් සමගින් වූ අනෙකුත් සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් ඔස්සේ වර්තමානයේ දී ආර්ථිකය තුළ යම් ස්ථාවරත්වයක් ඇති වී තිබේ. උක්ත සාධනීය ප්‍රතිඵල විනයානුකූල රාජ්‍ය මූල්‍ය පරිචයන්ගේ ප්‍රතිඵල වශයෙන් සැලකිය හැකි අතර, එය යථාර්තයක් බවට පත්විමට ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ කැපකිරීම් සහ අත්විඳි දුෂ්කරතා හේතුවිය.

පසුගිය දෙවසරට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය තත්ත්වය සැලකිය යුතු මට්ටමකින් ස්ථාවරත්වයට පත්වී තිබෙන නමුත්, මෙය කිසිසේත්ම සෑහීමට පත්විය යුතු අවස්ථාවක් නොවේ. දැනට පවත්නා ආර්ථික ස්ථාවරත්වය අත්‍යවශයෙන්ම රාජ්‍ය මූල්‍ය විනය පවත්වාගැනීම සහ සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල අඛණ්ඩව පවත්වා ගැනීම සමඟ බැඳී පවතී. මෙම ක්‍රියාමාර්ගවලින් අපගමනය වීම තුළින් රට පහසුවෙන්ම සීඝ්‍ර ආර්ථික පසුබෑමකට හසුවන විෂම චක්‍රයක් වෙත තල්ලු වනු ඇත.

අභ්‍යන්තර හා බාහිර අභියෝග තුළින් අනාගතයේදී එල්ලවිය හැකි දුෂ්කරතා පිළිබඳව සිතා බලා භාණ්ඩාගාරය විසින් මුදල් සංචිත ගොඩනැගීම සහ රාජ්‍ය මූල්‍ය ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී.

මෙම අවදානම් සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ආරම්භක අවධිය තුළ ඇතිවිය හැකි අනතුරුදායක තත්ත්වයන් පිළිබඳව විමසිලිමත් වීම අත්‍යාවශ්‍ය වේ. මෙම සන්දර්භය තුළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා රජයේ වියදම් දැරීමේ දී මුදලට අගය සහ වැය කරන සෑම රුපියලකටම උපරිම මහජන ප්‍රතිලාභ ලැබෙන බවට තහවුරු කරගත යුතු අතරම, විචක්ෂණශීලීත්වය හා විනයානුකූල බව පිළිබිඹුවන මූලධර්මවලට අනුකූල විය යුතු ය.

### 02. 2025-2027 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ ක්‍රමෝපායන්

i. බදු පරිපාලනය ශක්තිමත් කිරීම, බදු ජාලය පුළුල් කිරීම, අනුකූලතාවය වර්ධනය කිරීම සහ තාක්ෂණය යොදා ගැනීම තුළින් 2025 වසර වන විට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 15.1 දක්වාත්, ඉනික්බිතිව 2027 වසර වන විට සියයට15.3ක් දක්වාත් වැඩිකර ගැනීම.

ii. රජයේ වියදම්වලට මහජන ප්‍රතිලාභ උපරිම වන පරිදි ප්‍රතිපාදන වෙන් කිරීම වැඩිදියුණු කරන අතරම, විචක්ෂණශීලීව වියදම් කළමනාකරණය තුළින්, 2025 වසරෙන් ඔබ්බට රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 20ට අඩු මට්ටමක පවත්වාගෙන යාම.

iii. 2025 වසරේ සිට ඉදිරියට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම් ක්‍රමිකව වර්ධනය කරමින් සියයට 4ට වැඩි මට්ටමකින් පත්වාගෙන යාම.

iv. ප්‍රාථමික වියදම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යවස්ථාපිතව නියම කර ඇති සියයට 13ක මට්ටමට වඩා අඩුවෙන් පවත්වාගෙන යාම.

v. 2025 වසරේ සිට මධ්‍ය කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අවම වශයෙන් සියයට 2.3ක ප්‍රාථමික අතිරික්තයක් පවත්වාගෙන යාම.

vi. 2025 වසරේ සිට ඉදිරියට අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 5කට වඩා අඩු අගයකින් පවත්වාගෙන යාම.

vii. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, වගකීම්සහගත, විනයගරුක සහ පාරදෘශ්‍යභාවයෙන් ශක්තිමත් කිරීම සඳහා මෑතකාලීනව සිදුකරන ලද සහ ඉදිරියට සිදුකිරීමට නියමිත නෛතික සහ ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම.

viii. රාජ්‍ය ව්‍යාපාරවල ආදායම ඉහළ නැංවීම හා වියදම් තාර්කීකරණය.

### 03. 2025-2027 මධ්‍ය කාලය තුළ 2025 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම

වැය දරන ආයතන වෙතින් ලැබෙන වියදම් ඇස්තමේන්තු සලකා ඉහත රාජ්‍ය මූල්‍ය ඉලක්ක යටතේ දක්වා ඇති නියමයන්ට අනුකූල වන පරිදි මහාභාණ්ඩාගාරය විසින් ගැලපීම් සිදුකර, අවසන් වියදම් ඇස්තමේන්තු සකස් කරනු ලැබේ. එබැවින්, ඊට ගැලපෙන පරිදි ආයතනවල වියදම් ඇස්තමේන්තු සකස් කිරීම කෙරෙහි වැය දරන ආයතනවල ප්‍රමුඛ අවධානය යොමු විය යුතු වේ. මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට අමතරව ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2023 හි 03 ඡේදයේ සඳහන් කරුණු ද සුදුසු පරිදි අදාළ කරගනිමින්, 2025 වසර සඳහා වන වියදම් ඇස්තමේන්තු සැකසීම සිදු කළ යුතු වේ. තව ද, රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු (PERC) විසින් යම් ආයතනයක් සඳහා විශේෂිතව අදාළ කරගත යුතු බවට නිර්දේශ කර ඇති හා දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇති කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කළ යුතුය.

### 03.1 මූලධන වියදම්

i. සංවර්ධන වියදම්

මෑත කාලීන අධ්‍යයනයන් මගින් පෙන්වා දී ඇති පරිදි ප්‍රාග්ධන ව්‍යාපෘතිවලින් සැලකිය යුතු ප්‍රතිශතයක් අපේක්ෂිත කාලය තුළ සහ මුල් සමස්ත පිරිවැය ඇස්තමේන්තු තුළ නිම කිරීමට අපොහොසත් වී ඇත. අඩු පිරිවැයකින් යුතු සංකීර්ණ නොවන ව්‍යාපෘති සැලකිය යුතු සංඛ්‍යාවක පවා දුර්වල ප්‍රගතියක් සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් පෙන්නුම් කරයි. එවැනි ප්‍රමාද වීම් තුළින් පිරිවැය ඉහළ යාම සහ අතිශය සීමිත රාජ්‍ය සම්පත්වල උපරිම භාවිතය වළක්වාලන බැවින් එවැනි ප්‍රමාදවීම් අපේක්ෂා නොකරයි. එබැවින්, දැනට වැඩ ආරම්භ කර ඇති ව්‍යාපෘති හැකි ඉක්මනින් අවසන් කිරීමත්, නිමකර ඇති ව්‍යාපෘතිවල විභවය/ධාරිතාවය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමත් කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු ය. වර්ෂය තුළ අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමක් වේ.

නව ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඇතුළත් කිරීමේ දී ඒවායේ ශක්‍යතාවය සහ ආර්ථික වර්ධනයට හා සමාජ වටිනාකම් ඇති කිරීමට දක්වන දායකත්වය පිළිබඳ පැහැදිලි කරුණු ඉදිරිපත් කළ යුතු ය.

මීට අමතරව, පහත සඳහන් උපදෙස් පිළිපදිමින් 2025 වර්ෂය සඳහා වන වියදම් ඇස්තමේන්තු සැකසිය යුතු වේ.

(ආ). 2025 අයවැයට ඇතුළත් කරනු ලබන සංවර්ධන වියදම් සම්බන්ධයෙන් ඇමුණුම 1, 2 හා 3 හි දැක්වෙන ආකෘතීන් මඟින් ඉල්ලා ඇති තොරතුරු සැපයීම අනිවාර්ය වේ.

(ආ). ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය හා සබැඳිව අරමුදල් උපලබ්ධිය අත්හිටුවා ඇති/ අත්හිටුවා තිබූ විදේශ අරමුදල් යටතේ මූල්‍යයනය වන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විමසා සුදුසු පරිදි ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට කටයුතු කළ යුතු ය. එවැනි ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රතිපාදන සැලසීම සඳහා ඇමුණුම 03 හි ඉල්ලා ඇති තොරතුරු ලබා දීම අනිවාර්ය වේ.

(ඇ). මෑතකාලීන අධ්‍යයනවලින් අනාවරණය වන පරිදි රජය ප්‍රාග්ධන වියදම් සඳහා සිදු කරන ආයෝජන මගින් ජනිත වන ප්‍රාග්ධන වත්කම් ප්‍රමාණවත් පරිදි වාර්තා නොවන බව නිරීක්ෂණය වේ. වියදම් දැරීමේ දී සම්මත වැය විෂයයන් නිසි පරිදි භාවිතා නොකිරීම ඒ සඳහා බලපා ඇති එක් හේතුවකි. එබැවින්, සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීමේ දී, ඒ ඒ උප-ව්‍යාපෘතිය යටතේ සම්මත වැය විෂයයන්ට අනුව වෙන් වෙන්ව බෙදා ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු ය. නිදසුනක් ලෙස යම් උප-ව්‍යාපෘතියකින් ගොඩනැගිලි ඉදිකිරීම්, යන්ත්‍ර මිල දී ගැනීම්, මෘදුකාංග සංවර්ධනය ආදිය සඳහා මුදල් යොදවන්නේ නම් අදාළ උප-ව්‍යාපෘතිය යටතේ එක් එක් කටයුතු සම්බන්ධයෙන් විශේෂිතව දක්වා ඇති සම්මත වැය විෂයන් අනුව ප්‍රතිපාදන බෙදා වෙන් කළ යුතු වේ.

(ඈ). රජයේ ප්‍රතිපත්තිමය මග පෙන්වීම මත ආරම්භ කළ යුතු නව ව්‍යාපෘති වේ නම්, ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2023 මඟින් දක්වා ඇති ක්‍රමවේදය යටතේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහ "ජාතික සංවර්ධන කමිටුවේ" නිර්දේශ සහිතව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි නව ව්‍යාපෘති සඳහා පමණක් ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු වේ. කෙසේවුවත්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව නව සහ දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘති තෝරාගැනීම, ප්‍රමුඛතාගත කිරීම සහ ප්‍රතිපාදන ලබා දීම රාජ්‍ය ආයෝජන කමිටුව විසින් තීරණය කරනු ඇත.

(ඉ). "ජාතික මෙහෙයුම් මැදිරිය" (National Operations Room - NOR) හෝ ඊට පෙර ක්‍රියාත්මකව තිබූ "මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීමේ කමිටුව" (Committee on Re-strategizing and Acceleration of Mega Projects – RAMP Committee) මඟින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් ලබා දී ඇති නිර්දේශ මෙන්ම එම නිර්දේශ මත පදනම්ව ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ සහ ව්‍යාපෘතිවලට අදාළව ලබා දී ඇති අනෙකුත් අමාත්‍ය මණ්ඩල තීරණ කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

(ඊ). අයවැය යෝජනා ලෙස ආරම්භ කරන ලද ව්‍යාපෘති, අදාළ වසර තුළ කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතු වේ. එබැවින්, නිශ්චිතව දක්වා ඇති අවස්ථාවල දී හැර කිසිදු අයවැය යෝජනාවක් අදාළ වසරෙන් ඔබ්බට පවත්වාගෙන යාම වෙනුවෙන් ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ. තවදුරටත්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව මූලධන වියදම් සම්බන්ධයෙන් වන ඕනෑම නව යෝජනාවක් රාජ්‍ය ආයෝජන කමිටුව හා සම්බන්ධිත ක්‍රියාපටිපාටිවලට අනුකූල විය යුතුය.

(උ). ඉහත (ආ) හි සඳහන් අවස්ථාවලදී හැර විදේශ සංවර්ධන සහායක ආයතනවල මූල්‍යන සහාය මත ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල කාලය අවසන් වූ පසු එම ව්‍යාපෘති දේශීය අරමුදල් මඟින් තවදුරටත් පවත්වාගෙන යාමට ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ. එවැනි ව්‍යාපෘතිවල මෙහෙයුම් හා නඩත්තු වියදම් වේනොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සම්මත වැය විෂයයන් යටතේ ආයතනයේ වියදම් ඇස්තමේන්තුවට ඇතුළත් කළ යුතු ය.

(ඌ). පෞද්ගලික අංශයේ සෘජු ආයෝජන වශයෙන් හෝ රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා (Public Private Partnership - PPP) ආයෝජන වශයෙන් ශක්‍යතාවය සහිත ව්‍යාපෘති සඳහා ව්‍යාපාරික යෝජනා කැඳවීම දිරිමත් කරනු ලැබේ. එහිදී, ව්‍යාපෘතිවලින් උත්පාදනය වන ආදායම මඟින් වියදම් හැකිතාක් දුරට ආවරණය කර ගැනීමට හැකිවන පරිදිත්, රජය වෙත අසම්භාව්‍ය බැරකම් ඇති නොවන පරිදිත්, ව්‍යාපාරික ආකෘති (business models) සකස් කර ගත යුතු වේ.

(එ). රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘතිවල මුළු පිරිවැය, රජය මඟින් අදාළ පෞද්ගලික පාර්ශව වෙත සිදුකරන වාර්ෂික ගෙවීම් (annuity payments) ආකාරයෙන් පියවීම සඳහා ව්‍යාපාරික ආකෘති සැලසුම් නොකළ යුතු වේ.

(ඒ). සංවර්ධන ව්‍යාපෘතිවල දී පුනර්ජනනීය බලශක්ති භාවිතය, නවීන තාක්ෂණය භාවිතය හා ඩිජිටල්කරණය යන අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

(ඔ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ නොකරන ලද හා රාජ්‍ය ආයෝජන වැඩසටහනෙහි ඇතුළත් නොවන සංවර්ධන ව්‍යාපෘති සඳහා සංචිත ප්‍රතිපාදන ලෙස ප්‍රතිපාදන ලබාදෙනු නොලැබේ. මෙහි 03.1.i ඡේදයේ (ආ) වගන්තිය අනුව මෙවැනි ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන කමිටුව වෙත ඉදිරිපත් කිරීම කළ නොහැක.

(ඕ) රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාව හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් 2024.08.05 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති තීරණය අනුව දත්ත හුවමාරුව/ තොරතුරු පද්ධති ඒකාබද්ධ කිරීම තුළින් වඩාත් හොඳ සේවාවක් ලබාදීමට පහසුකම් සැලසීම සඳහා පුද්ගලයන් සහ ආයතන වෙන්කොට හඳුනාගත හැකිවන පරිදි රාජ්‍ය ආයතනවල දැනට පවත්නා තොරතුරු පද්ධතීන් සහ ඉදිරියේදී ඇති කිරීමට සැලසුම් කරන තොරතුරු පද්ධතීන් වැඩි දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

ii. ආයතනික මූලධන වියදම්

(අ). ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2021 මඟින් රථ වාහන මිල දී ගැනීම සම්බන්ධයෙන් පනවා ඇති සීමා කිරීම්, 2025 වසර සඳහා ද එලෙසම ක්‍රියාත්මක වේ.

(ආ). ධාරිතා සංවර්ධනය යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු විදේශ පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු ය. එවැනි පුහුණු අවශ්‍යතා, මාර්ගගත ක්‍රම (virtual methods) හා දේශීය ආයතන මඟින් සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.

(ඇ). දේශීය පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් කළ යුත්තේ සේවා ව්‍යවස්ථා, බඳවාගැනීමේ පටිපාටි සහ චක්‍රලේඛ විධිවිධාන මඟින් එවැනි පුහුණුවීම් නියම කර ඇත්තේ නම් හෝ අදාළ නිලධාරියාගේ රාජකාරිය සඳහා සෘජුවම අත්‍යාවශ්‍ය වන්නේ නම් පමණි.

iii. නඩත්තු, පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්

දැනට පවතින වත්කම්වල ධාරිතාවය උපරිම ලෙස උපයෝජනය කරමින් ඒවායේ තිරසාර බව සහතික කිරීම සඳහා නඩත්තුව, පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් වෙනුවෙන් අත්‍යාවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම පිළිබඳව නිසි අවධානය යොමු කිරීමට අවශ්‍ය වේ. ඒ අනුව, මූලධන ඇස්තමේන්තු සකස් කිරීමේ දී, පවතින වත්කම් ආරක්ෂා කරගනිමින්, ඒවායින් උපරිම ඵලදායීතාවයක් ලබාගනිමින්, නිසි මහජන සේවා පවත්වාගෙන යාමට ප්‍රමුඛතාවය ලබා දිය යුතු වේ.
විශේෂයෙන් මහාමාර්ග, දුම්රිය මාර්ග, රෝහල්, පාසල්, ප්‍රධාන වේලි හා ජලාශ, වැව් අමුණු හා ඇල මාර්ග නඩත්තු කිරීම් සඳහා නිසි නඩත්තු සැලැස්මක් යටතේ අවශ්‍ය වන ප්‍රතිපාදන නිශ්චිතව සඳහන් කර ඇස්තමේන්තු මඟින් වෙන්කර ගැනීම අවශ්‍ය වේ.

iv. පළාත් සභා යාන්ත්‍රණය උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කිරීම

පළාත් සභා වෙත සෘජුව පැවරී ඇති කාර්යයන් සඳහා රේඛීය අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු යටතේ ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ප්‍රාදේශීය මට්ටමින් සිදුකරනු ලබන වැඩසටහන්/ව්‍යාපෘති පළාත් සභා වැඩසටහන්/ව්‍යාපෘති සමඟ ද්විකරණය වීම වැළැක්වීම සඳහා ඒවා සම්බන්ධයෙන් පළාත් සභා සමඟ සම්බන්ධීකරණය වී සැලසුම් සකස් කරගත යුතු වේ.

එසේම, පළාත් සභා යටතේ සැලකිය යුතු කාර්ය මණ්ඩලයකින් යුත් ආයතන පද්ධතියක් පවතින බැවින්, රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතනවල සේවා සැලසීම සඳහා හැකි සෑමවිටම පළාත්සභාවල එකඟතාවය මත එම ආයතන ව්‍යුහය යොදා ගත යුතු වේ.

## 03.2 පුනරාවර්තන වියදම්

පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ දී පහත සඳහන් කරුණු සලකා බැලිය යුතු වේ.

i. වැටුප්, වේතන, අතිකාල සහ වෙනත් දීමනා

(අ). මේ වන විටත් විභාග පවත්වා හා/හෝ සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති 2025 වසර ආරම්භ වන විට නියත වශයෙන් ම බඳවා ගැනීම් සිදු වන බවට තහවුරු වන අවස්ථාවලදී හැර නව බඳවා ගැනීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ.

(ආ). 2024.06.30 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව පදනම් කරගෙන, 2025 වසර සඳහා වැටුප්, වේතන හා අනෙකුත් දීමනා ඇස්තමේන්තු, එක් එක් නිලධරයන් වෙනුවෙන් වෙන් වෙන්ව ගණනය කර, එම තොරතුරු ආයතන මට්ටමින් සකස් කර, ඇමුණුම 4හි දක්වා ඇති ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු වේ. පුද්ගල පඩිනඩි සඳහා වැය විෂය කේතය 1503 යටතේ අයවැය ප්‍රතිපාදන වෙන්කරන නිලධාරීන් පිළිබඳව ද, මෙම ආකෘතිය අනුව එක් එක් ආයතනය සඳහා වෙන වෙනම විස්තර ද ඉදිරිපත් කළ යුතු වේ.

(ඈ). රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතුව පත් කළ නිලධාරී කමිටුවේ නිර්දේශ අනුව එළැඹ ඇති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීම් සඳහා ප්‍රතිපාදන අවශ්‍යතාව, බඳවාගැනීමේ ප්‍රගතිය අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසා සලසා ගත යුතු වේ.

ii. සංවර්ධන සහනාධාර හා සුබසාධන වියදම්

යම් නීතියක් මගින් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් සහිතව දෙනු ලබන සහනාධාර හැර ආයතන මට්ටමින් තීරණ ගෙන ක්‍රියාත්මක කරන කිසිදු සහනාධාරයක් හෝ සුබසාධන වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ.

## 03.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධ ඇස්තමේන්තු, ඇමුණුම 5 හි ලබා දී ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු වේ. වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යනු ලබන ආයතන විසින් ඒ සම්බන්ධයෙන් වන ඇස්තමේන්තු, ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් වන පරිදි සුදුසු ආකෘතියකින් ඉදිරිපත් කළ යුතු වේ.

## 03.4 දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිචාරාත්මක බව

මෑත කාලීනව ගෝලීය අවධානය යොමු වූ ප්‍රධානතම කරුණක් ලෙස දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන රාජ්‍ය මූල්‍ය අවදානම හඳුන්වා දිය හැක. ශ්‍රී ලංකාව ද දේශගුණික විපර්යාසවල බලපෑමට ලක් වීමේ අවදානම ඉහළ යමින් පවතින ප්‍රවණතාවයක් සහිත රටක් වන බැවින් ඒ තුළින් සිදු විය හැකි ආපදා සහ ඒවාට ඔරොත්තුදීමේ හැකියාව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. ඒ අනුව එවැනි අවදානම් නිසි ලෙස හඳුනාගැනීම, ඒවා අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක බව ඉහළ නැංවීම සහ ඒවාට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් 2025 අයවැය සැකසීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතු ය. විශේෂයෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ පූර්වෝපායන් ඇතුළත් කළ යුතු ය.

## 03.5 තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු 17 සහ ඉලක්ක 169 ට අනුව වියදම් ඇස්තමේන්තු ගැළපීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් අඩංගු වර්ගීකරණ මාර්ගෝපදේශය, තිරසර සංවර්ධන සභාව (Sustainable Development Council) විසින් නිකුත් කර ඇති අතර, එම වර්ගීකරණ මාර්ගෝපදේශය තිරසර සංවර්ධන සභාවේ https://sdc.gov.lk/ වෙබ් අඩවියෙන් බාගත කළ හැක. එම මාර්ගෝපදේශය අනුව හා තිරසර සංවර්ධන සභාවේ තාක්ෂණික සහය ද සහිතව ඔබ ආයතනයන් තුළ මෙම කාර්යය සඳහා දැනටමත් හඳුනාගෙන ඇති විශේෂිත නිලධාරීන් (SDG Focal Point Officer) මගින් සියලුම අයවැයගත වියදම්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන්, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සමඟ ගැළපීම් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ සකස් කරන ලද අයවැය තොරතුරු ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ද පිටපතක් සහිතව, තිරසර සංවර්ධන සභාව වෙත info@sdc.gov.lk යන ලිපිනයට මෘදු පිටපතක් ලෙස විද්‍යුත් තැපෑල මගින් වියදම් ඇස්තමේන්තු යොමුකරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතු ය.

## 03.6 ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිචාරාත්මක බව

තිරසර සංවර්ධන අරමුණු අංක 5 මගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා සියලුම කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම ඉලක්ක කර ඇති බැවින්, වාර්ෂික අයවැය සකස් කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය (gender responsive) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

## 03.7 ප්‍රතිපාදන ලබාදීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ

පහත දැක්වෙන ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ඇත.

(අ). අත්‍යවශ්‍ය මහජන සේවා සහ නඩත්තු කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන

(ආ). වගකීම්/ බැඳීම් නිරවුල් කිරීමට හෝ ගිණුම්ගත කිරීමට අවශ්‍ය වන ප්‍රතිපාදන

(ඇ). ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම මත නැවත ආරම්භ කිරීමට සිදු වන විදේශ සහය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන

(ඈ). අවසන් කිරීමට ආසන්න වැඩ කොටස් අවසන් කිරීම

(ඉ). ආරම්භ කර ඇති ව්‍යාපෘති/ වැඩසටහන්වල ඊළඟ පියවර සඳහා ප්‍රතිපාදන

i. අර්ධ වශයෙන් නිමකර ඇති ව්‍යාපෘතිවල තීරණාත්මක කාර්යයන් පමණක් නිම කරමින් ඒවා පරිහරණය කළ හැකි තත්ත්වයට පත්කිරීම
ii. අත්හිටුවීමට තීරණය කර ඇති ව්‍යාපෘතිවල දැනට සිදුකර ඇති කාර්යයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කටයුතු කිරීම
iii. ව්‍යාපෘතිවල අනෙකුත් ඉදිරි පියවර සිදුකිරීම

(ඊ) ඉහත 03.1. i හි සඳහන් පරිදි ඇතුළත් කළ හැකි නව ව්‍යාපෘති

අයවැය ඇස්තමේන්තු මඟින් වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන සලසා දෙනු ලබන සියලුම ආයතන මෙම උපදෙස් පිළිපැදිය යුතු වේ.

### 03.8 වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

ඉහත කරුණු සලකා බලා නිසි පරිදි පිළියෙළ කරනු ලබන වියදම් ඇස්තමේන්තු අදාළ සියලුම උපලේඛන ද සමඟ **2024 අගෝස්තු 28** වන දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වේ.

ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා වියදම් ඇස්තමේන්තු සඳහා 2025EXP_ES සැලසුම් පිටපත (version) ද, අත්තිකාරම් ගිණුම් ඇස්තමේන්තු සඳහා 2025ADV_ES සැලසුම් පිටපත (version) ද භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතු වේ. 2025-2027 වර්ෂ සඳහා වන මැදිකාලීන අයවැය ඇස්තමේන්තුව තුළ 2025 වසර සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ 2026 සහ 2027 වර්ෂ සඳහා වන පුරෝකථන අයවැය ඇස්තමේන්තු, මෙම මාර්ගගත පද්ධතිය ඔස්සේ ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

ඊට අමතරව, වියදම් ඇස්තමේන්තු හා අදාළ සියලුම උපලේඛනවල මෘදු හා දෘඪ පිටපත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ITMIS පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා යම් සහායක් අවශ්‍ය වන්නේ නම්, දුරකථන අංක 011-2484999 හරහා ITMIS Helpdesk නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

### 04. ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

### 05. පැහැදිලි කරගැනීම

මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරන විෂය භාර මාණ්ඩලික නිලධාරියා සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

**අත්/කළේ. කේ. එම්. මහින්ද සිරිවර්ධන**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් : (i) ජනාධිපති ලේකම්
(ii) අග්‍රාමාත්‍ය ලේකම්
(iii) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv) විගණකාධිපති
(v) ලේකම්, මුදල් කොමිෂන් සභාව